# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 මාර්තු


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 මාර්තු මාසයේ ලක්‍ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 21.5%ක් බව එහි අධ්‍යක්‍ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 පෙබරවාරි මාසයේ ලක්‍ෂ්‍යමය මතුපිට උද්ධමනය 17.5%ක් ලෙස වාර්තා විය. 2022 මාර්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 13.8%ක හා ආහාර නොවන කාණ්ඩයේ 7.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 මාර්තු මාසයේ 5.1%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.0%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.1%ක් විය. 2021 මාර්තු මාසයට සාපේක්ෂව 2022 මාර්තු මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්‍ෂ්‍යමය) 2022 පෙබරවාරි මාසයේදී 24.7% සිට 2022 මාර්තු මාසයේදී 29.5% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්‍ෂ්‍යමය) 2022 පෙබරවාරි මාසයේදී 11.0% සිට 2022 මාර්තු මාසයේදී 14.5% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 පෙබරවාරි මාසයේ 167.8ක් වූ දර්ශකාංකය 2022 මාර්තු මාසයේ 172.7ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 මාර්තු මාසයේ දර්ශකාංකය 4.9ක වැඩිවීමක් එනම් 2.9ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 1.22%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 1.70%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූවිට සහල්, පොල්තෙල්, මයිසූර් පරිප්පු, කිරිපිටි, බිත්තර, අළුත් මාළු, පාන්, සීනි, කරවල, කුකුළු මස්, පළතුරු, මිරිස් කුඩු, තිරිඟු පිටි, වියළි මිරිස්, පොල්, තුනපහ කුඩු සහ බිනිස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වෙතත් එළවළු, ලොකු ළූණු, අර්තාපල්, රතු ළූණු, අමු මිරිස් සහ දෙහි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 මාර්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(අරක්කු සහ බුලත්)*, ‘රෙදිපිළි හා පාවහන්", 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(LP ගෑස්)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය' *(පෞද්ගලික රෝහල් කාමර ගාස්තු සහ ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම)*, 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල් සහ බස් ගාස්තු)*, 'විනෝදාත්මක හා සංස්කෘතික', 'ආපනශාලා සහ හෝටල්' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද 'සන්නිවේදන' කාණ්ඩයේ සුළු වැඩිවීමක් දක්නට ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට ‘අධ්‍යාපන' කාණ්ඩයේ දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්‍ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 පෙබරවාරි මාසයේ 14.1% සිට 2022 මාර්තු මාසයේ 17.3% දක්වා වැඩිවීමක් වාර්තා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | මාර්තු | 142.1 | 150.7 | 135.3 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 8.8 | 2.0 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 150.8 | 135.5 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 9.7 | 2.2 | 4.1 |
| | මැයි | 143.6 | 153.3 | 135.9 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 10.3 | 2.5 | 4.2 |
| | ජූනි | 145.7 | 157.3 | 136.5 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 9.8 | 2.9 | 4.1 |
| | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |